// ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අති විශෙෂ

අංක 1843/4 – 2013 දෙසැම්බර් මස 30 වැනි සඳුදා - 2013.12.30

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# IV (අ) වැනි කොටස - පළාත් සභා

## පළාත් සභා නිවේදන

### බස්නාහිර පළාතේ පළාත් සභාව

1989 අංක 12 දරන පළාත් සභා (ආනුෂාංගික) විධිවිධාන පනතේ 2 වැනි වගන්තිය සමඟ කියවිය යුතු 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 223 වැනි වගන්තිය යටතේ වූ නියමය

බස්නාහිර පළාතේ ගරු ප්‍රධාන අමාත්‍ය, මුදල් හා ක්‍රමසම්පාදන, නීතිය හා සාමය, ඉඩම්, අධ්‍යාපන, පළාත් පාලන හා පළාත් පරිපාලන, වෙළඳ, විදුලිබල හා බලශක්ති, මිනිස් බල හා රැකීරක්ෂා සහ ආර්ථික ප්‍රවර්ධන පිළිබඳ අමාත්‍ය ප්‍රසන්න රණතුංග වන මම, 1989 අංක 12 දරන පළාත් සභා (ආනුෂාංගික) විධිවිධාන පනතේ 2 වැනි වගන්තිය සමඟ කියවිය යුතු 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 223 වැනි වගන්තියෙහි සඳහන් විධිවිධාන අනුව පහත සඳහන් නියමය මෙයින් නිවේදනය කරමි.

ප්‍රසන්න රණතුංග,
බස්නාහිර පළාතේ පළාත් සභාවේ ගරු ප්‍රධාන අමාත්‍ය, මුදල් හා ක්‍රමසම්පාදන,
නීතිය හා සාමය, ඉඩම්, අධ්‍යාපන, පළාත් පාලන හා
පළාත් පරිපාලන, වෙළඳ, විදුලිබල හා බලශක්ති, මිනිස් බල හා රැකීරක්ෂා
සහ ආර්ථික ප්‍රවර්ධන පිළිබඳ අමාත්‍ය.

2013 දෙසැම්බර් මස 30 වැනි දින,
කොළඹ 07,
ශ්‍රීමත් මාකස් ප්‍රනාන්දු මාවතේ,
ශ්‍රාවස්ති මන්දිරයේ දී ය.

නියමය

1. මෙම නියමය බස්නාහිර පළාතේ ප්‍රාදේශීය සභාවන්හි 2014 වර්ෂය සඳහා වූ අයවැය ලේඛන බලාත්මක කිරීම සම්බන්ධයෙන් වූ නියමය වශයෙන් හැඳින්වේ.

2. බස්නාහිර පළාත තුළ යම් ප්‍රාදේශීය සභාවක් සඳහා 2014 වර්ෂයට අදාළ අයවැය ලේඛනයක් යම් 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 168 වැනි වගන්තියෙහි සඳහන් විධිවිධාන ප්‍රකාරව සම්මත නොවුණු කල්හි හා 2012 අංක 21 දරන පළාත් පාලන ආයතන (විශේෂ විධිවිධාන) පනතෙහි 17 වැනි වගන්තිය ප්‍රකාරව අදාළ ප්‍රාදේශීය සභාවේ සභාපති ධුරය පුරප්පාඩු වී ඇති

විටක දී, එම පුරප්පාඩු සභාපති ධුරය පිරවීම සඳහා 2012 අංක 22 දරන පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් (සංශෝධිත) පනතෙහි විධිවිධාන අනුව කටයුතු කර නොමැති විටකදී හෝ එසේ පුරප්පාඩු වූ ධුරය සඳහා පත්වූ සභාපතිවරයෙකුට 2014 වර්ෂය සඳහා අයවැය ලේඛනයක් සම්මත කර ගැනීමට අදාළ වූ යෝජනාවක් සභාවට ඉදිරිපත් කිරීමට ඊට අදාළ ලිඛිත නීතියට අනුකූලව විය යුතු අවම දින ප්‍රමාණය ඉතිරි නොවුණු අවස්ථාවක අදාළ ප්‍රාදේශීය සභාව වෙත 2014 වර්ෂය සඳහා පිළියෙළ කරන ලද යම් අයවැය ලේඛනයක් අදාළ ප්‍රාදේශීය සභාව පිහිටි දිස්ත්‍රික්කයේ පළාත් පාලන සහකාර කොමසාරිස්ගේ අනුමැතිය යටතේ එකී ප්‍රාදේශීය සභාව විසින් 2014 වර්ෂය සඳහා ක්‍රියාත්මක කිරීම නීත්‍යානුකූල වන්නේ ය.

3. මෙම නියමයෙහි සඳහන් සියළු විධිවිධානයන් 2012 අංක 21 දරන පළාත් පාලන ආයතන (විශේෂ විධිවිධාන) පනතෙහි විධිවිධානයන්ට සහ 2012 අංක 22 දරන පළාත් පාලන ආයතන ඡන්දවිමසීම් (සංශෝධිත) පනතෙහි විධිධානයන්ට යටත්ව ක්‍රියාත්මක වන්නේ ය.

01-416/1

---

## බස්නාහිර පළාතේ පළාත් සභාව

1989 අංක 12 දරන පළාත් සභා (ආනුෂාංගික) විධිවිධාන පනතේ 2 වැනි වගන්තිය සමඟ කියවිය යුතු 255 අධිකාරය වන නගර සභා ආඥාපනතේ 247 වැනි වගන්තිය යටතේ වූ නියමය

බස්නාහිර පළාතේ ගරු ප්‍රධාන අමාත්‍ය, මුදල් හා ක්‍රමසම්පාදන, නීතිය හා සාමය, ඉඩම්, අධ්‍යාපන, පළාත් පාලන හා පළාත් පරිපාලන, වෙළඳ, විදුලිබල හා බලශක්ති, මිනිස් බල හා රැකීරක්ෂා සහ ආර්ථික ප්‍රවර්ධන පිළිබඳ අමාත්‍ය ප්‍රසන්න රණතුංග වන මම, 1989 අංක 12 දරන පළාත් සභා (ආනුෂාංගික) විධිවිධාන පනතේ 2 වැනි වගන්තිය සමග කියවිය යුතු 255 අධිකාරය වන නගර සභා ආඥාපනතේ 247 වැනි වගන්තියෙහි සඳහන් විධිවිධාන අනුව පහත සඳහන් නියමය මෙයින් නිවේදනය කරමි.

ප්‍රසන්න රණතුංග,
බස්නාහිර පළාතේ පළාත් සභාවේ ගරු ප්‍රධාන අමාත්‍ය, මුදල් හා ක්‍රමසම්පාදන,
නීතිය හා සාමය, ඉඩම්, අධ්‍යාපන, පළාත් පාලන හා
පළාත් පරිපාලන, වෙළඳ, විදුලිබල හා බලශක්ති, මිනිස් බල හා රැකීරක්ෂා
සහ ආර්ථික ප්‍රවර්ධන පිළිබඳ අමාත්‍ය.

2013 දෙසැම්බර් මස 30 වැනි දින,
කොළඹ 07,
ශ්‍රීමත් මාකස් ප්‍රනාන්දු මාවතේ,
ශ්‍රාවස්ති මන්දිරයේ දී ය.

### නියමය

1. මෙම නියමය බස්නාහිර පළාතේ නගර සභාවන්හි 2014 වර්ෂය සඳහා වූ අයවැය ලේඛන බලාත්මක කිරීම සම්බන්ධයෙන් වූ නියමය වශයෙන් හැඳින්වේ.

2. බස්නාහිර පළාත තුළ යම් නගර සභාවක් සඳහා 2014 වර්ෂයට අදාළ අයවැය ලේඛනයක් යම් 255 අධිකාරය වන නගර සභා ආඥාපනතේ 178 වැනි වගන්තියෙහි සඳහන් විධිවිධාන ප්‍රකාරව සම්මත නොවුණු කල්හි හා 2012 අංක 21 දරන පළාත් පාලන ආයතන (විශේෂ විධිවිධාන) පනතෙහි 12 වැනි වගන්තිය ප්‍රකාරව අදාළ නගර සභාවේ සභාපති ධුරය පුරප්පාඩු වී ඇති විටක දී, එම පුරප්පාඩු සභාපති ධුරය පිරවීම සඳහා 2012 අංක 22 දරන පළාත් පාලන ආයතන ඡන්දවිමසීම් (සංශෝධිත) පනතෙහි විධිවිධාන අනුව කටයුතු කර නොමැති විටකදී හෝ එසේ පුරප්පාඩු වූ ධුරය සඳහා පත්වූ සභාපතිවරයෙකුට 2014 වර්ෂය සඳහා අයවැය ලේඛනයක් සම්මත කර ගැනීමට අදාළ වූ යෝජනාවක් සභාවට ඉදිරිපත් කිරීමට ඊට අදාළ ලිඛිත නීතියට අනුකූලව විය යුතු අවම දින ප්‍රමාණය ඉතිරි නොවුණු අවස්ථාවක අදාළ නගර සභාව වෙත 2014 වර්ෂය සඳහා පිළියෙළ කරන ලද යම් අයවැය ලේඛනයක් අදාළ නගර සභාව පිහිටි දිස්ත්‍රික්කයේ පළාත් පාලන සහකාර කොමසාරිස්ගේ අනුමැතිය යටතේ එකී නගර සභාව විසින් 2014 වර්ෂය සඳහා ක්‍රියාත්මක කිරීම නීත්‍යානුකූල වන්නේ ය.

3. මෙම නියමයෙහි සඳහන් සියළු විධිවිධානයන් 2012 අංක 21 දරන පළාත් පාලන ආයතන (විශේෂ විධිවිධාන) පනතෙහි විධිවිධානයන්ට සහ 2012 අංක 22 දරන පළාත් පාලන ආයතන ඡන්දවිමසීම් (සංශෝධිත) පනතෙහි විධිධානයන්ට යටත්ව ක්‍රියාත්මක වන්නේ ය.

01-416/2

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.